1286


නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - හක්වටුනාඔය
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் - ஹக்வடுனாஓய
Resident Project Management Office – Hakwatunaoya

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

IMD

එගොඩගම
මාළිය
எகொடகம
மாஎலிய
Egodagama
Maeliya


1 8 MAR 2019

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No – 9/3/1 | ඔබේ අංකය / உமது இல. / Your Ref No | දිනය / திகதி / Date – 2019/02/22 |

01). ගොවිසංවිධාන නිලධාරින්,
නියෝජිත මහත්ම / මහත්මින්,

02). රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ ආයතන ප්‍රධානින්,
නිලධාරි මහත්ම මහත්මින්,

## 2019 යල කන්නයේ පෙර කන්න රැස්වීම සහ 2019 පෙබරවාරි මස ව්‍යාපාර කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව

දිනය - 2019.02.22

ව්‍යාපාරයේ නම - හක්වටුනාඔය ව්‍යාපාරය
ස්ථානය - හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය
වේලාව - පෙ.ව.9.30

01.සහභාගිත්වය

1.1 විශේෂ ආරාධිතයින්

මෙදින රැස්වීමට විශේෂ ආරාධිතයින් ලෙස පොලොන්නරුව රන්දීප් පුද්ගලික සමාගමේ අලෙවි ප්‍රවර්ධන නිලධාරි ටිරාන් කොඩිකාර මහතා සහ ඩයලොග් පුද්ගලික සමාගමේ තිරසාරත්ව සංවර්ධන අංශයේ ප්‍රවාරක නිලධාරි දූලිමි මහත්මිය සහභාගි විය.

1.2 නිරීක්ෂකයින්

නිරීක්ෂක මහතුන් කිසිවෙකු සහභාගි නොවීය,

1.3 සහභාගි වූ රාජ්‍ය නිලධාරින්

1.ඩබ්.එම්.ඩී ගාමිණී කුසුම් ශ්‍රියානන්ද - නේවාසික ව්‍යාපෘති කළමනාකරු
2 ජී.ආර් අයි.එස් ගම්ලත් - ඉංජිනේරු සහකාර - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3.එච්.එම.ජයමාන්න.- ගොවිජනසංවර්ධනප්‍රාදේශිය නිළධාරී-ගොවිජනසේවා මධ්‍යස්ථානය,රඹෑ
4. ඩබ්ලිව්.ඒ.එස්.සී.කේ.කේ.කොත්මලේ -කෘෂිකර්ම උපදේශක,ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
5.අයි.එම්.පි.කේ ඉලංගකෝන් - සංවර්ධන නිලධාරි - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,පොල්පිතිගම.
6. ඒ.එම්.එච්.ඊ.අමරසිංහ - සංවර්ධන නිලධාරි - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,පොල්පිතිගම.
6.ඩබ්ලිව්.බී.එම්.ධම්මිකා වීරසේකර - කෘ.ප.නි.සහකාර (වසම් අංක 373 අගාර)
7.ආර්. ඒ.සී.රණසිංහ - කෘ.ප.නි.සහකාර (වසම් අංක 395/369)
8.පී.ඩී.සිරිවර්ධන - කෘ.ප.නි.සහකාර (රබේ)
9.ආර්.පි.ආර්.ජයපාල - කෘ.ප.නි.සහකාර (රබේ)
10.කේ.එම්.එන්.එස්.පද්මසිරි - කෘ.ප.නි.ස. (ව අං.366)
11.එම්.පි.කේ.රණසිංහ - කෘ.ප.නි.සහකාර (ව. අං. 368)
12.එල්.ඩී.සී.එන්.ජයසේකර - කෘ.ප.නි.ස (ව. අං.367)
13.ආර්.එම්.එස්.එන්.බණ්ඩාර - කෘ.ප.නි.ස. (තලාකොළවැව)
14.පී.ඒ.එම්.සී.යූ.කරුණාරත්න - කෘ.ප.නි.සහකාර
15.බී.පි.ජයසුමන - කෘ.ප.නි.සහකාර

16.එම්.එච්.එන්.එම්.කුමාරි-සං. නිළ - නේ.ව්‍යා. ක.කාර්යාලය
17.පී.ජී.ඩී.කුමුදුනී වීරසිංහ- සං. නිළ - නේ.ව්‍ය. ක.කාර්යාලය
18.එම්.පී.ටී.ප්‍රමෝදනී - සං. නිළ -නේ.ව්‍ය. ක.කාර්යාලය
19.ඩබ්.එම්.ටී.ඩබ්.මැණිකේ - සං. නිළ - නේ.ව්‍ය. ක.කාර්යාලය
20.අයි.ජී.එස්.සිරිවර්ධන- සං. නිළ-නේ.ව්‍ය. ක.කාර්යාලය
21.ටී.එම්.ආර්.කේ.තෙන්නකෝන් - සං. නි. - වාරි.දෙපා.
22. ඊ.එම්.ඩී.එන්.චන්ද්‍රතිලක - තාක්ෂණ සහායක - වාරි. දෙපා.
23.ආර්.එම්. නිමල් - ජල පාලක - වාරි. දෙපා
24.ඩබ්ලිව්.බී.ජේ.ප්‍රනාන්දු - ජල පාලක - වාරි. දෙපා

1.4 සහභාගි වූ ගොවිසංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්

1. ඊ.එම්.විජේසූරිය ඒකනායක - ගරු සභාපති
(ව.ඉ.ඩී 3 සිසිල්පොකුණ බෙ.ගොවි සංවිධානය )
2. ආර්.ඩී.ගුණතිලක - ගරු සභාපති
(ව.ඉ.ඩී 4 ට්‍රැක් 7 තම්බුව බෙ.ගොවි සංවිධානය ).
3. ඊ.එම්.ජයතිලක-ගරුසභාපති
(ව.ඉ.ඩී5කුලංකට්ටය අලුත්වැව ගොවි සංවිධානය)
4.ආර්.එම්.අයි.එස්.බී.රාජපක්ෂ-ගරු භාණ්ඩාගාරික
(ව.ඉ.ඩී5කුලංකට්ටය අලුත්වැව ගොවි සංවිධානය)
5. කේ.ඩී.පියදාස- ගරු භාණ්ඩාගාරික
(ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
6.ඩී.එම්.යු.පතිරාජ - ගරු සභාපති
(ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
7.එච්.එම්.පී.නවරත්න - ගරු භාණ්ඩාගාරික
( ද.ඉ.යා 04 බෝගොල්ල ගොවි සංවිධානය)
8.අයි.එම්.කේ.මුදියන්සේ
( ද.ඉ.යා 04 බෝගොල්ල ගොවි සංවිධානය)
9. ඒ.එම්.යු.කේ කරුණාරත්න -ගරු සභාපති
(ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙ.ඇල ගොවි සංවිධානය)
10. එස්.එම්.ජයරත්න - ගරු භාණ්ඩාගාරික
(ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙ.ඇල ගොවි සංවිධානය )
11.කේ.වී අමරතුංග-.ගරු සභාපති
(ව.ඉ.ඩී 6 චතුරැස්ස බෙදුම්ඇල ගොවි සංවිධානය )
12. ආර්.එම්.නවරත්න බණ්ඩාර - ගරු සභාපති
(ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙ.ගොවි සං.)
13. ඩබ්ලිව්.එම්.ජී.වඩිගනෙත්ති කාරක සභික
(ද.ඉ.යාය 4 කෝරුවාගාල බෙ.ගොවි සං.)
14. ඩබ්ලිව්.ආරියරත්න - ගරු ලේකම්
(ව.ඉ.ඩී 3 යාය 4 අගාරකටුගම්පල බෙ.ගොවි සංවිධානය)
15.එච්.ජේ.පතිරණ - ගරු සභාපති
(ව.ඉ.ඩී 3 යාය 4 අගාරකටුගම්පල බෙ.ගොවි සංවිධානය)
16.ජේ.ඒ.එන්.ආරියසිංහ- ගරු භාණ්ඩාගාරික
(ව.ඉ.ඩී 3 යාය 4 අගාරකටුගම්පල බෙ.ගොවි සංවිධානය)
17.ඩී.එම්.එස්.එන්.ප්‍රේමචන්ද්‍ර - ගරු සභාපති
(අනිකට්ඇල ගොවිසංවිධානය)
18ආර්.එම්.ටී.බංඩා - ගරු ලේකම්
(ව.ඉ.ඩී 3 යාය 4 අගාරකටුගම්පල බෙ.ගොවි සංවිධානය)
19. ආර්.ඒ.ප්‍රේමරත්න - ගරු සභාපති
(උඩයට පාලගම ගොවිසංවිධානය)
20.ජේ.එම්.කේ.හේරත් බංඩා - ගරු උප සභාපති
(යාය 05 ගොවිසංවිධානය)
21.එච්.එම්.අබේරත්න - ගරු ලේකම්
(යාය 06 ගොවිසංවිධානය)
22.ඩී.එම්.හීන් බංඩා
(යාය 06 ගොවිසංවිධානය)
23.එච්.එම්.රන්මැණිකා - ගරු භාණ්ඩාගාරික
(යාය 06 ගොවිසංවිධානය)
24.එච්.එම්.පී.කුමාරි - ගරු භාණ්ඩාගාරික
(ව.ඉ.ඩී 3 සිසිල්පොකුණ බෙ.ගොවි සංවිධානය )
25.ආර්.ඒ.ආර්.වීරසිරි
(යාය 05 කෝරුවාගාල)

## 02. පිළිගැනීම

ප්‍රථමයෙන් ආගම සිහිකිරිමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් රැස්වීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරි මහත්ම මහත්මීන් සහ ගොවිසංවිධාන නියෝජිත මහත්ම මහත්මීන් පිළිගන්නා ලදි.

## 03. අරමුණ පැහැදිලි කිරිම

2018/19 මහ කන්නය සාර්ථකව අවසන් කර ඇති බැව් පවසමින්,2019 යල කන්නය ආරම්භ කිරිම සඳහා වගා කාල සටහන සකස්කර ගැනීම,ගොවිසංවිධාන නඩත්තු මෙහෙයුම් කටයුතු පිළිබඳ හා ආයතන සංවර්ධන කටයුතු ආදිය පිළිබඳ අද දින පෙර කන්න රැස්වීමෙන් සාකච්ඡා කිරිමට අපේක්ෂා කරන බව පැවසීය.

## 04.පසුගිය වාර්තාව සභාසම්මත කිරිම

2019.01.10 දින පැවති මාසික ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම් වාර්ථාවේ අඩුපාඩු නොමැති බව සියළුදෙනාගේ අදහස වූ බැවින් ඒකමතිකව වාර්තාව සභාසම්මත කර ගන්නා ලදි.

05.වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව

මෙදින රැස්වීම සඳහා විශේෂ ආරාධිතයින් ලෙස සහභාගි වූ රන්දීප් ආයතනයේ සහ ඩයලොග් ආයතනයේ නිලධාරින්ට ගොවිමහතුන් සඳහා වන ඔවුන්ගේ දැනුවත් කිරිම් සිදු කිරිමට නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් අවස්ථාව ලබාදෙන ලදි.

රන්දීප් පුද්ගලික සමාගමේ අලෙවි ප්‍රවර්ධන නිලධාරි

රාජ්‍ය ආයතන වල අනුමැතියද සහිතව වර්තමානයේ ගොවිජනතාවගේ කෘෂිකාර්මික කටයුතු සඳහා පවතින අභියෝග ජය ගැනීමට රන්දීප් පුද්ගලික සමාගම විසින් හඳුන්වා දී ඇති යන්ත්‍ර සූත්‍ර පිළිබඳ ගොවිසංවිධාන නිලධාරින් දැනුම්වත් කරන ලදි.එහිදී සහනදායි ක්‍රමයට ගොවිසංවිධාන වෙත මෙම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි බවත් එම ආයතනය හරහා ඉදිරියේදි පවත්වනු ලබන වොලිබෝල් තරගාවලියට ගොවිසංවිධාන සාමාජිකයින්ට සහභාගි වියහැකි බව පවසන ලදි.

ඩයලොග් පුද්ගලික සමාගමේ ප්‍රචාරක නිලධාරි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ඩයලොග් ආයතනය එක්ව සිදුකරන 616 ගොවි මිතුරු සේවාව පිළිබඳ ගොවිසංවිධාන නියෝජිතයින් දැනුම්වත් කරන ලදි.ඩයලොග් ආයතනයේ තිරසර සංවර්ධන අංශය මගින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන මගින් කෘෂිකාර්මික කටයුතු වල බිම් සැකස්මේ සිට පසු අස්වනු තාක්ෂණය දක්වා තොරතුරු කෙටි පණිවිඩ ක්‍රමය ඔස්සේ ගොවිජනතාව වෙත ලබා දෙන අතර කන්නයෙන් කන්නයට මෙම තොරතුරු යාවත්කාලීන කරන බව දන්වා සිටින ලදි.

04.ආයතන සංවර්ධන කටයුතු

නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා - හක්වටුනාඔය ව්‍යාපාරය

මහාවාරි ව්‍යාපාර ආශ්‍රිත ගොවිසංවිධාන තරගාවලියේ මූලික අදියර යටතේ හක්වටුනාඔය ව්‍යාපාරයේ ගොවිසංවිධාන ලබා ගත් ලකුණු ප්‍රමාණය පිළිබඳ ගොවි සංවිධාන නිලධාරින් දැනුවත් කළ අතර ඉදිරි දිස්ත්‍රික් තරගාවලිය සඳහා සුදානම් වන ලෙස දැනුම්වත් කරන ලදි.

එමෙන්ම හක්වටුනාඔය මධ්‍ය ගොවිසංවිධානය මගින් සංවිධානය කරන බක්මහ උළෙළ 2019.04.25 දින පැවැත්වීමට සුදානම් කර ඇති බවත් සියළු ගොවිසංවිධාන එක්ව ඒ කටයුතු සාර්ථක කර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම්වත් කරන ලදි.

අනතුරුව 2018/19 මහ කන්නයේ කන්න තීන්දු අනුව ජලය නිකුත් කිරිම මේ වනවිට අවසන්ව ඇති අතර ඉහල අස්වැන්නක් ලබා ගනිමින් කන්නය සාර්ථකව නිමා කිරිමට හැකි වූ බවත් පවසමින් 2019 යල කන්නය සඳහා වගා තීන්දු තීරණ ගැනිම සඳහා යොමු වන ලදි.ඒ අනුව පසුගිය මහ කන්නය පිළිබඳ ප්‍රගතිය සහ මී ලඟ යල කන්නය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,වාරිමාර්ග දෙපාර්තමේන්තුව යනාදී ආයතන වල යෙදවුම් හා සේවාවන් වල තත්වය පිළිබඳ ගොවිසංවිධාන නිලධාරින් දැනුවත් කිරිමට අවස්ථාව ලබා දෙන ලදි.

4.1කෘෂිකාර්මික කටයුතු

ඉදිරිපත් කිරිම - ඩබ්ලිව්.ඒ.එස්.සී.කේ.කේ.කොත්මලේ , කෘෂිකර්ම උපදේශක

2019 යල කන්නය සඳහා තීන්දු තීරණ ගැනීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු කාලගුණික පුරෝකතනය මේ වන තෙක් ලැබී නොමැති බැවින් කන්නය පිළිබඳ ඍජු ප්‍රකාශයක් කිරිමට අපහසු බව පවසන ලදි.

එසේ වුවද යල කන්නය සඳහා මාස 3 , 3 ½ වී ප්‍රබේද භාවිතා කිරිම සුදුසු බවත් එමගින් වගා කාලය අවම කර ගැනීම , ජල නාස්තිය අවම කර ගැනීම මෙන්ම කිඩෑ හානියට විශේෂ ප්‍රතිරෝදකයක් වෙමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වන ගොවි නිලධාරින් දැනුම්වත් කරන ලදි.මෙවර යල කන්නය අප්‍රේල් 15 වනවිට ආරම්භ කර අගෝස්තු මුල් කාලය වනවිට වගාකටයුතු අවසන් කිරිම සුදුසු බව පැවසීය.ගොවිමහතුන්ගේ බිත්තර වී අවශ්‍යතාවය කෘෂිකර්ම උපදේශක මහතුන් හරහා දැනුවත් කරන ලෙසත් නිසි ප්‍රමිතියෙන් යුත් බිත්තර වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ලබාගත හැකි බවද පවසන ලදි.

එමෙන්ම 2018/19 මහ කන්නයේ දී කිඩෑ හානිය වී වගාව සඳහා බලපෑම් කළ බවත් එසේ හානියට පත් වූ වගා බිම් නිරි වගාව ද විනාශ වන ලෙස පුළුස්සා දමන ලෙස දැනුවත් කළ අතර වගාව පිහිටුවීමෙන් පසු කෘමි හානි පිළිබඳ නිරන්තර අවදානයෙන් පසුවීමට ගොවි ජනතාව දැන්වත් කරන ලෙස පවසන ලදි.

4.2 වාරිමාර්ග කටයුතු

ඉදිරිපත් කිරිම - ජී.ආර් අයි.එස් ගම්ලත් - ඉංජිනේරු සහකාර

අද දිනට ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 22.02 ක් බවත් එය අක්කර අඩි 14962 ක් බවත් පවසන ලදි.එම ජල ප්‍රමාණයෙන් ප්‍රයෝජනයට ගත හැකි ප්‍රමාණය අක්කර අඩි 11939 ක් පැවසීය.

පසුගිය 2018/19 මහ කන්නය පිළිබඳ අදහස් දක්වමින් කන්නයේ වගා කටයුතු සඳහා අක්කර අඩි 5133 නිකුත් කර ඇති බවත් වර්ෂා ජලයෙන් වගාව ආරම්භ කළ නිසා ජලය ඉතිරි කර ගැනීමට හැකි වූ බව පවසන ලදි.එමෙන් ම අක්කරයට බුසල් 100,120 ත් අතර ඉහල අස්වැන්නක් ලබාගත හැකි වූ බවත් අක්කරයක වගා කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අක්කර අඩි 4.25 ජල ධාරිතාවයක් වැය වී ඇති බව ද ගොවිසංවිධාන නිලධාරින් දැනුම්වත් කරන ලදි.

ඒ අනුව ජලාශයේ පවතින ජල ධාරිතාවය අනුව මෙවර කන්නයේ ජලාශය අශ්‍රිතව අක්කර 2500 පමණ වගා කිරිමට නිර්දේශ කළ හැකි බව පවසන ලදි.අනතුරුව පසුගිය වසර කිහිපයක වර්ෂාපතන රටාව වාරිමාර්ග දෙපාර්තමේන්තු දත්ත අනුව ඉදිරිපත් කරන ලදි.

| අප්‍රේල් මාසය (මිලිමීටර්) | මැයි මාසය(මිලිමීටර්) |
|---|---|
| 2015 - 476 | |
| 2016 - 142 | 2016 - 513 |
| 2017 - 172 | 2017 - 228 |
| 2018 - 141 | 2018 - 554 |

මෙම කාලගුණික දත්ත වලට අනුව ඉදිරි කන්නය සඳහා වර්ෂාපතනය අපේක්ෂා කළ හැකි වුවද පවතින වියළි කාලගුණික තත්වය නිසා ජලාශයේ පවතින ජලය අපතේ නොයවා ප්‍රයෝජනයට ගැනීමට ඇලවේලි නිසි පරිදි ශුද්ධ කළයුතු බවට උපදෙස් ලබා දෙනලදි. CRIP ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක ඇලවේලි පවතින නමුත් එම ව්‍යාපෘතියෙහි වැඩ අවසන් ඇලවේලි වල නිර්මිත අවට නිසි පරිදි ශුද්ධ කරන ලෙස දැනුවත් කළ අතර අතුරු බෝග සඳහා වැලි සහිත කුඹුරු තෝරා ගන්නා ලෙස පවසන ලදි.

4.3 යෙදවුම් හා සැපයුම් සේවා

ඉදිරිපත් කිරිම - එච්.එම්.ජයමාන්න.- ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිළධාරි

පසුගිය කන්නයේ පොහොර සහනාධාර යටතේ ගොවිසංවිධාන වෙත පොහොර නිකුත් කිරිම සාර්ථකව සිදු කිරිමට හැකි වුවද ප්‍රවාහන කටයුතු වලදී යම් යම් ගැටළු සිදු වු බවත් ඉදිරියේ දී ඒවා මගහරවා ගැනීමට කටයුතු කරන බව පැවසීය.

2019 යල කන්නය සඳහා පොහොර චක්‍රලේඛන මෙතෙක් ලැබී නොමැති බවත් එය ලැබුණු විගස ඒ අනුව කටයුතු කරන බව පැවසීය.

වගා කටයුතු සඳහා බිත්තර වී සපයා ගැනීමේදී නිර්දේශිත බිත්තර වී පමණක් ලබා ගැනීමට කටයුතු කිරිමෙන් වගාවේ ඇතිවන ගැටළු සහගත අවස්ථා අවම කර ගැනීමට හැකි බවත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව නිෂ්පාදිත බිත්තර වී මෙවරද ගොවි ජනතාව වෙත ලබා දීමට කටයුතු කරමින් පවතින බවත් පවසන ලදි.එමෙන්ම ගොවි බැංකු හරහා ක්‍රියාත්මක ණය වැඩසටහනෙහි අවම රු. 50000.00 ව තිබු ණය මුදල රු.100000.00 දක්වා මෙවර වැඩි කර ඇති බවද පැවසීය.

එසේම මෙම කන්නයේ අක්කර බදු එකතු කිරිම මාර්තු මස 31 වන විට අවසන් කිරිම කළයුතු බැවින් ඒ සඳහා අදාල නිලධාරින්ට සහය වන ලෙස දන්වා සිටින ලදි.වාර්ෂිකව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අලුත් සහල් මංගල්‍ය මෙවර ද ජය ශ්‍රී මහ බෝසමිදුන් අභියස අප්‍රේල් මස 6 සහ 7 දෙදින පවත්වන බවත් ගොවිජනතාවගේ බැතිබර දායකත්වය ඒ සඳහා ලබාදිය හැකි බවද වැඩිදුරටත් පවසන ලදි.

එසේම කන්න රැස්වීමේදී ගන්නා ලද තීන්දු තීරණ අනුව කටයුතු කිරිමෙන් ගැටළු අවම කර ගත හැකි බව පැවසු අතර එම ක්‍රමවේදය අනුගමනය කිරිමට ගොවි ජනතාව හුරුවිය යුතු බවට උපදෙස් ලබා දෙනලදි.

05.2019 යල කන්නය සඳහා වගා කාල සටහන් සැකසිමට යෝජනා සාකච්ඡා ඉදිරිපත් කිරිම

ගරු සභාපති - වදුරුස්ස ගොවිසංවිධානය

2019 මාර්තු 10වනවිට ඇලවේලි ශුද්ධ කර අප්‍රේල් 10 වනවිට වපුරා අවසන් කිරිම සුදුසු බව පවසන ලදි.එසේම කන්නයේ කටයුතු ආරම්භ කිරිමට පෙර ප්‍රධාන ජලාශයේ කිරි ඉතුරුම් මංගල්‍ය මාර්තු 13 දින සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි.

ගරු සභාපති - තල්වැහැර ගොවිසංවිධානය

2019 යල ආරම්භ කිරිම සඳහා මාර්තු 13 වන දින කිරිඉතුරුම් මංගල්‍යය පැවත්වීම සුදුසු බවත් මාර්තු 20 වන දින ජලය නිකුත් කිරිම සුදුසු බවටත් අදහස් දක්වන ලදි.

ගරු සභාපති - සියඹලාවැව ගොවිසංවිධානය

වම් ඉවුර සහ දකුණු ඉවුර ගොවිසංවිධාන වල සියළු යෝජනා අදහස් සලකා බලමින් තවමත් අස්වනු නෙලීමේ කටයුතු වල යෙදී සිටින ගොවි මහතුන්ටද අපහසුතාවයක් ඇති නොවන පරිදි 2019 මාර්තු 13 වන දින කිරි ඉතුරුම් මංගල්‍යය පවත්වා මාර්තු 25 ජලය නිකුත් කරමින් යල් කන්නය ආරම්භ කිරීමට යෝජනා කළ අතර එයට සියළු ගොවි මහතුන්ගේ එකගතාවය ලැබුණි.

එමෙන්ම මාස 3 ,3 ½ වී වර්ග වගා කිරීමටත් අමතර බෝග වගා කිරීමට ගොවිමහතුන් වැඩි ප්‍රමාණයක් යොමු කිරීම සුදුසු බවත් තවදුරටත් පවසන ලදි.

### 06. පෙර කන්න රැස්වීමේ වගා තීරණ දැනුම්දීම

ඉදිරිපත් කිරීම - නේවාසික ව්‍යාපෘති කළමණාකරු,හක්වටුනාඔය ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් (සංශෝධිත) 1969 අංක 48 දරණ වාරිමාර්ග අඥාපනතේ විධිවිධාන අනුව 2019/02/22 දින හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලයේදී පවත්වන ලද හක්වටුනාඔය මහාවාරි ව්‍යාපාරයේ 2019 යල කන්නය සඳහා යෝජිත වගා කාල සටහන.

| අනු අංකය | කාරණය | තීන්දුව |
|---|---|---|
| 1. | වගා කරනු ලබන බිම් ප්‍රමාණය | දකුණු ඉවුර සහ වම් ඉවුර අක්කර 6371 |
| 2. | වගා කරනු ලබන බෝගය | මාස 3 , 3 ½ වී සහ අතිරේක බෝග |
| 3. | වගාව සඳහා ජලය නිකුත් කිරීම | 2019/03/25 |
| 4. | ඇළ වේළි ශුද්ධ කිරීම<br>ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මඟින්)<br>බෙදුම් ඇළ (ගොවි සංවිධානය මඟින්)<br>කෙත් ඇළ (ගොවීන් විසින්) | <br>2019/03/20 ට පෙර<br>2019/03/20 ට පෙර<br>2019/03/20 ට පෙර |
| 5. | ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම | 2019/03/25 ට පෙර<br>(ගොවි සංවිධාන අරමුදල් යොදා) |
| 6. | වගා කටයුතු ආරම්භ කිරීම | 2019/03/25 සිට |
| 7. | වගාව පිහිටුවා අවසන් කිරීම | 2019/04/10 ට පෙර |
| 8. | මුර ජලය නිකුත් කිරීම | 2019/04/12 |
| 9. | වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම | 2019/07/15 |
| 10. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2019/07/15පෙර |
| 11. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | හානී වී දින14 ක් ඇතුළත |
| 12. | අස්වනු නෙළා අවසන් කළයුතු දිනය | 2019/08/15 ට පෙර |

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

1. කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

2. නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

3. ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.

4. වාරි නිර්මිත වලට හානි කිරීම හා අනවසරයෙන් බට දැමීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව

විශේෂ කරුණු

ඉහත පෙර කන්න රැස්වීමේදී ගන්නා ලද තීන්දු තීරණ ජලාශයේ පවතින ජල තත්වය , ප්‍රදේශයේ පවතින කාලගුණික වෙනස් වීම් මත යම්කිසි අවදානමක් ගැනීමට සිදු වුවහොත් එහි වගකීම ගොවිසංවිධාන විසින් භාර ගන්නා බවට ගොවිසංවිධාන සියල්ලම එකග විය.

ඉහත 2019 යල කන්නය සඳහා පෙර කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවට දකුණු ඉවුර යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති ජී.එම්.යු.කේ.කරුණාරත්න මහතා විසින් යෝජනා කරන ලද අතර, වම් ඉවුර ඩී 4 ට්‍රැක් 07 තම්බුව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති ආර්.ඩී.ගුණතිලක මහතා විසින් එය ස්ථිර කරන ලදි.

## 07.ලිපි ඉදිරිපත් කිරීම

(1).වී වගාව සඳහා ජල අවශ්‍යතාවය දැනුම් දෙමින් යාය 05 ගොවිසංවිධානයේ ගරු ලේකම්තුමා විසින් ගොවිමහතුන් 17 ගේ අත්සන් ද සහිතව ඉදිරිපත් කර තිබූ ලිපිය පෙර කන්න රැස්වීමට ඉදිරිපත් කරන ලදි.

ගරු උප සභාපති - යාය 05 ගොවිසංවිධානය

අක්කර 35 ක් පමණ වූ මෙම කුඹුරු යාය වගල් කුඹුරු වීම හේතුවෙන් වගා කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වූ බවත් ක්ෂේත්‍රය පරීක්ෂා කර බලා එක ජල මුරයක් පමණක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

(2).තලාකොළ වැව ගොවිසංවිධානයේ ඩී 5 ඇළෙහි කුඹුරු සඳහා එක් ජල මුරයක් ලබා ගැනීමෙ අවශ්‍යතාව සඳහන් කරමින් එච්.එම්. ධනපාල මහතා විසින් ගොවි මහතුන් 19 ගේ අත්සන්ද සහිතව එවා තිබූ ලිපිය රැස්වීමට ඉදිරිපත් කරන ලදි.

එච්.එම්. ධනපාල මහතා

ඉහල වැවෙහි ජලය පිරී තිබුණද වගා කටයුතු සඳහා එම ජලය භාවිතා නොකරන බව පැවසූ අතර හක්වටුනා ජලාශයෙන් ඉතා සීමිත ජල ප්‍රමාණයක් දකුණු ඇලට නිකුත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු,හක්වටුනාඔය ව්‍යාපාරය**

2018/19 මහ කන්නයේ වගා තීරණ අනුව ජලය නිකුත් කිරීම අවසන් බැවින් නැවත ජලය නිකුත් කිරීමට නම් ඒ සම්බන්ධව ව්‍යාපාර කමිටුවේ තීන්දු තීරණ ගෙන දිස්ත්‍රික් ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගතයුතු බව ගැටළු ඉදිරිපත් කළ ගොවිමහතුන් දැනුවත් කළ අතර ඒ සඳහා වෙනත් ක්‍රියාමාර්ගයක් පවතී නම් කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදි.

**ජී.ආර් අයි.එස් ගම්ලත් මිය - ඉංජිනේරු සහකාර**

යාය 05 ගොවිසංවිධානයේ ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ජලය පොම්ප කර ගැනීමේ යන්ත්‍රයක් ලබාදිය හැකි බව පවසන ලදි.එම ගොවිසංවිධානය එයට එකග වූ බැවින් ඒ සඳහා ඉල්ලීම් ලිපියක් ලබා දෙන ලෙස දැනුවත් කරන ලදි.

**එච්.එම.ජයමාන්න මහතා.- ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී**

තලාකොලවැව ගොවිසංවිධානයේ ජල ගැටළුව පිළිබඳ අදාල ගොවිමහතුන් සහ එම වසම් වල කෘ.ප.නි.ස නිලධාරින් සමග සාකච්ඡා කර තීරණයක් ලබාදිය හැකි බව පවසන ලදි.

**ගරු සභාපති - උඩයට පාලගම ගොවිසංවිධානය**

උඩයට පාලගම වැවෙන් තලාකොල වැවෙහි ඩී 05 ට ජලය ලබා දෙන්නේ නම් මුලිකව ඩී 04 දොර සකස් කළ යුතු බවත් එසේ නොවුනහොත් අස්වනු නෙලමින් පවතින කුඹුරු වලට හානියක් බවත් පැවසීය.

**ගරු සභාපති - මධ්‍ය ගොවිසංවිධානය**

මහාවාරි යටතේ පොහොර , ජලය ලබා ගන්නා සුළු වාරි ගොවිමහතුන් නිසා ගැටළු ඇති වී ඇති බැවින් කන්න රැස්වීම් තීරණ වලට එරෙහිව කටයුතු කිරීම බොහෝ ගැටළු ඇති වීමට හේතුවක් වන බව පවසා සිටි අතර අස්වනු නෙලමින් පවතින කුඹුරු වලට හානියක් නොවන පරිදි ජලය ලබාගත යුතු බව පවසන ලදි.

**ගරු සභාපති - සියඹලාවැව ගොවිසංවිධානය**

ගොවිසංවිධාන ක්ෂේත්‍රය තුල ඇති වන ගැටළු හැකි පමණ ක්ෂේත්‍රය තුලදීම විසදා ගැනීමට උත්සහා ගතයුතු බවත් එසේ විසදා ගැනිමට නොහැකි ගැටළු පමණක් ව්‍යාපාර කමිටුව ඉදිරිපත් කළයුතු බවත් පවසන ලදි.

08.ස්තුතිය

පෙර කන්න රැස්වීමට සහභාගි වූ සියළුම රාජ්‍ය නිලධාරින්ට සහ ගොවිසංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්ට රැස්වීමට සහභාගිවීම වෙනුවෙන් නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතාගේ ස්තුතිය පිරිනැමීමෙන් අනතුරුව සභාවේ වැඩකටයුතු ප.ව 1.00 පමණ අවසන් කරන ලදි.

ඩබ්.එම්.ඩී.ගාමිණී කුසුම් ශ්‍රියානන්ද
නේවාසික ව්‍යාපාර කළමනාකරු.
හක්වටුනාඔය ව්‍යාපාරය.

ඩබ්. එම්.ඩී. ගාමිණී කුසුම් ශ්‍රියානන්ද
නේවාසික ව්‍යාපාර කළමනාකරු
හක්වටුනාඔය ව්‍යාපාරය
එගොඩගම - මා එළිය

ජේ.එම්.යූ.කේ.කරුණාරත්න
ගරු ලේකම්,
ඒකාබද්ද ගොවි සංවිධානය.

පිටපත්:-.

1. අධ්‍යක්ෂතුමිය - වරිමාර්ග කළමණාකරන අංශය-කොළඹ (කා.දැ.පි)
2. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමිය-කුරුණෑගල (කා.දැ.පි)
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ-කුරුණෑගල (කා.දැ.පි)
4. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්තුමා - කුරුණෑගල (කා.දැ.පි)
5. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂතුමිය - කුරුණෑගල (කා.දැ.පි)
6. ප්‍රාදේශීය ලේකම්- පොල්පිතිගම (කා.දැ.පි)
7. දිස්ත්‍රික් කළමණාකරු -පොහොර ලේකම් කාර්යාලය (කා.දැ.පි)
8. වාරිමාර්ග ඉන්ජිනේරුතුමා - ඉබ්බාගමුව (කා.දැ.පි)
9. ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරීතුමා-රඹේ (කා.දැ.පි)
10. සහකාර අධ්‍යක්ෂ-කෘෂිරක්ෂණ මණ්ඩලය- මහව (කා.දැ.පි)
11. පරිපාලන ග්‍රාම නිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
12. ජනපද නිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
13. මුලස්ථාන කෘෂිකර්ම උපදේශකතුමා - රඹේ (කා.දැ.පි)
14. සියලුම අදාල වසම්වල කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන් (කා.දැ.පි)
15. සියලුම ගොවි සංවිධාන නිළධාරී මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය (කා.දැ.පි)